**07-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබට දෙව්ලොව ස්වාධිපත්‍ය ලැබෙන්නේ ස්මෘතිය මඟින් පමණක් නිසා ලැබෙන හැම විටම හුදකලාව හිඳ සත්‍ය ආදරවන්තයාව සිහිකරන්න.

**ප්‍රශ්නය:** ඔබට දැන් පරම පියා හමු වී ඇති නිසා, ඔබ අවසන් කර දැමිය යුත්තේ කුමන අප්‍රවේශමද?

**පිළිතුර:** ඇතැම් දරුවන් කිසිවක් ගණන් නොගනිමින් ඔවුන් කොහොමත් බාබාට අයිති බව කියයි. ස්මෘතිය සඳහා උත්සාහ නොකරයි. දිගින් දිගටම ස්මෘතියෙන් සිටීම අමතක කරයි. මේ වූ කලී අප්‍රවේශම නම් වේ. බාබා මෙසේ කියයි : දරුවනි, ඔබ ස්මෘතියේ සිටියොත් ස්ථිර සතුට අත්විඳිය හැකියි. කිසිඳු ආකාරයක හුස්ම හිරවීමක් සිදු නොවේ. බැඳීම් ඇති අය දිවා රෑ දුක් ස්මෘතියෙන් සිටිනවා සේ ඔබද නිරන්තර ස්මෘතියෙන් සිටිය යුතුව ඇත.

**ගීතය:** මගේ වාසනාව උදාකරගනිමින් මම පැමිණ සිටිමි...

ඕම් ශාන්ති. බාබා මෙසේ කීවේ දරුවන්ට වන අතර ඔබ දරුවන්ද ''ඕම් ශාන්ති'' කියයි. පියාද මෙසේ කියයි ඕම් ශාන්ති. මෙහි තේරුම වන්නේ ඔබ ජීවාත්ම සත්තාවන් සාමයේ ප්‍රතිමූර්තීන් බවයි. පරම පියාද සාමයේ ප්‍රතිමූර්තියයි. ජීවාත්ම සත්තාවන්ගේ මුල් ආගම සාමයයි. පරමාත්මාගේ මුල් ආගමද සාමයයි. ඔබ සාම දේශයේ නිවැසියන් ද වෙයි. පරම පියා මෙසේ කියයි මාද එහි නිවැසියකු වෙමි. ඔබ දරුවන් නැවත උපදී මා එසේ වන්නේ නැත. මම මේ රථයට ඇතුල්වනවා පමණි. මේ මගේ රථයයි. ඔබ ශංකර්ගෙන් ඇසුවොත් - ඔබට ඇත්තටම ඇසිය නොහැකි වුවත් සූක්ෂම කලාපයේ දී හෝ එසේ ඇසුවහොත් ඔහු පිළිතුරු දෙන්නේ එම සූක්ෂම ශරීරය ඔහුගේ බවයි. ශිව බාබා මෙසේ කියයි මේ මගේ ශරීරය නොවේ. මා ද භෞතික ඉන්ද්‍රියන්ගේ සහය ලැබීම අවශ්‍ය නිසා මෙය ණයට අරගනිමි. පළමු හා වැදගත් ලෙසම විස්තර කළ යුතු දෙය නම් ශ්‍රී ක්‍රිෂ්ණා පාරිශුද්ධකරුවා හෝ ඥාන සාගරය හෝ නොවන බවය. ශ්‍රී ක්‍රිෂ්ණා අපිරිසිඳු ජීවාත්ම සත්තා පිරිසිඳු නොකරයි. ඔහු පැමිණ පිරිසිඳු ලෝකය පාලනය කරයි. පළමුව කුමාරයෙක් බවට පත් වී ඊළඟට අධිරාජ්‍යයෙක් වෙයි. ඔහුට මෙම ඥානය නැත. නිර්මාණය පිළිබඳ ඥානය ඇත්තේ නිර්මාපකයාට පමණි. ශ්‍රී ක්‍රිෂ්ණා වූ කලී නිර්මාණයයි. පරම පියා නිර්මාණකයා පැමිණ ඔබට මෙම ඥානය දෙයි. ඔහු දැන් නිර්මාණය කරන අතර මෙසේ කියයි ඔබ මගේ දරුවන්ය. ඔබ, ''බාබා අප ඔබට අයිතියි'' යැයි කියයි. බ්‍රහ්මා මඟින් බ්‍රාහ්මින්වරු නිර්මාණය වේ යැයි කියැවේ. බ්‍රාහ්මින්වරු වෙන කොහෙන් එන්නද? සූක්ෂම කලාපයේ වෙනත් බ්‍රහ්මා කෙනෙක් නැත. ඉහළ සිටින කෙනාමයි පහළත් සිටින්නේ. ඔහු ඉහළ සිටී ඔහුම පහළ ද සිටී. හොඳයි. එවිට විෂ්ණු සහ ලක්ෂ්මී සහ නාරායන ද එසේ ම වෙයි. ඔවුන් පැමිණෙන්නේ කොහින්ද? බ්‍රහ්මා විෂ්ණු බවට පත් වෙයි. බ්‍රහ්මා සහ සරස්වතී නාරායන සහ ලක්ෂ්මී බවට පත් වී චක්‍රය පුරාවට උපත් 84ක් ගෙන නැවත බ්‍රහ්මා සහ සරස්වතී බවට සංගම් යුගයේ දී පත් විය. ලක්ෂ්මී සහ නාරායන මනුෂ්‍යයන් වන අතර ඔවුන් අයත් වන්නේ දේව ආගමටය. විෂ්ණු අත් හතරක් ඇති ව පෙන්වයි. එය නිරූපණය කරන්නේ පවුල් මාර්ගයයි. භාරතයේ මුල සිටම පවුල් මාර්ගය තිබුණි. මේ නිසයි විෂ්ණුට අත් හතරක් ඇත්තේ. මෙහි සිටින්නේ බ්‍රහ්මා සහ සරස්වතී. සරස්වතී යනු හදාගත් දරුවෙකි. මොහුගේ නියම නම ලේඛ්රාජ් වන අතර ඉනික්බිතිව බ්‍රහ්මා ලෙස නම් විය. ශිව බාබා මොහු තුළට ඇතුළු වී රාධේද අයිති කරගෙන ඇයට සරස්වතී යන නම තැබුවේය. බ්‍රහ්මා යනු සරස්වතීගේ භෞතික පියා නොවේ. ඔවුන් දෙදෙනාටම ඔවුන්ගේම භෞතික පියවරු සිටියා. ඔවුන් තව දුරටත් මෙහි නැත. බ්‍රහ්මා මඟින් ශිව බාබා ඇයව හදාගත්තේය. ඔබ දරුවන්ද හදාගන්නා ළමයින්ය. බ්‍රහ්මාද ශිව බාබාගේ දරුවෙකි. ඔහු බ්‍රහ්මාගේ මුව කමල තුළින් නිර්මාණය නිමවන අතර මේ නිසාම බ්‍රහ්මා මව ලෙස ද හඳුන්වයි. මෙසේ ගැයේ ඔබ මවත් පියත් වන අතර අප ඔබේ දරුවන්ය. අප ඔබේ අනුකම්පාව තුළින් බොහෝ සතුට අත්විඳිමු. ඔබ බ්‍රාහ්මින්වරු දරුවන් බවට පත් වී සිටී. මෙය තේරුම් ගැනීමට ඉතා පළල් බුද්ධියක් අවශ්‍යය. ඔබ දරුවන් උරුමය ලබා ගන්නේ ශිව බාබාගෙනි. බ්‍රහ්මා දෙව්ලොව නිමවන්නා නොවන අතර ඥාන සාගරයද නොවේ. ඥාන සාගරය වන්නේ පරම පියා පමණි. ජීවාත්ම සත්තාවන්ගේ පියා ඥාන සාගරයයි. ජීවාත්ම සත්තාවන්ද කුඩා සාගර වන නමුත් ඔවුන් එසේ නොකියන්නේ සාගරය එකක්ම නිසාය. ඔබ සැම ගංගාවන් වෙයි. සාගරයට ඔහුගේ ම වූ ශරීරයක් නොමැති අතර ඔබට නම් ඇත. ඔබ ඥාන ගංගාවන්ය. කල්කටාවේ ඇති බ්‍රහ්ම පුත්‍ර ගංගාව ඉතා දිග වන්නේ සාගරය හා සම්බන්ධ නිසාය. මෙම සංගමය (මේලා) ඉතා විශාලය. මෙහිදීද මේලාවක් සිදුවේ. සාගරයත් බ්‍රහ්ම පුත්‍රත් එකතු වේ. මේ සංගමය සජීවී අතර

අනෙක අජීවීය. පරම පියා මේවා මෙසේ විස්තර කරයි. ඒවා ග්‍රන්ථ වල නැත. ග්‍රන්ථ වූ කලී භක්ති මාර්ගයේ කොටසකි. මෙය ඥාන මාර්ගය වන අතර එය භක්ති මාර්ගයයි. භක්ති මාර්ගයේ එම කොටස චක්‍ර භාගයක් එලෙසම තිබුණි. එවිට ඥාන සාගරය එහි නොමැත. පරම පියා, උත්තරීතර පියා, උත්තරීතර ජීවය, ඥාන සාගරය සංගම යුගයේදී පැමිණ ඔබ සැමට ගැලවීම ලබා දෙන්නේ ඔබව ඥානයෙන් නහවමින්ය. ඔබ දන්නවා අසීමිත පියා තුළින් ඔබ දෙව්ලොව සතුට නම් වූ වාසනාව නිමවා ගන්නා බව. සත් යුගයේ දී හා ත්‍රේත යුගයේ දී අප වන්දනාවට සුදුසු දෙවි දේවතාවන් වූහ. දැන් අපි වන්දනාකරුවන් වන මනුෂ්‍යයින් වී සිටිමු. පසුව මනුෂ්‍ය බවින් දේවත්වය බවට පත් වෙයි. බ්‍රහ්මින්වරු පළමුව දේව ආගමටත් ඉන්පසු ක්ෂත්‍රිය, වෛශ්‍ය සහ ශුද්‍ර බවට ද පත් විය. උපත් 84ක් ගන්නා විට ඔබ පිරිහීමට පත් වේ. පරම පියා ඔබට කියා දී ඇත්තේ ඔබ ඔබගේම උපත් නොදන්නා බවයි. උපත් 84ක් ගන්නේ ඔබ පමණි. පළමුව එන අය උපත් 84ම ගනී. අපිරිසිදුකම ඉවත් කළ හැක්කේ යෝගාවෙන් පමණි. යෝගාව සඳහා උත්සාහය අවශ්‍යය. ඇතැම් දරුවන් ඥානයෙන් දක්ෂ වුවත් යෝගාවෙන් දුබලය. බැඳීම් ඇති අය නිදහස් අයට වඩා යෝගයෙන් ඉහළය. ඔවුන් ශිව බාබා මුණගැසීමට දිවා රෑ නොබලා වෙහෙසෙති කෙසේවෙතත්, ඔබට දැනටමත් ඔහුව හමු වී ඇත. ඔබට ස්මෘතියේ සිටිය යුතු යැයි කීවත් ඔබ නැවත නැවතත් අමතක කරයි. ඔබ බොහෝ කුණාටු අත්දකිනවා වුවත් ඔවුන්ගේ ස්මෘතියේ ඔවුන් වෙහෙස දරයි. ඔබ වෙහෙස දරන්නේ නැත. ඔවුන් ගෙදර සිටම ඉහළ තත්ත්වයක් හිමි කරගනියි. ඔබ දරුවන් දන්නවා ශිව බාබාගේ ස්මෘතියේ සිටිමින් දෙව්ලොව ස්වාධිපත්‍ය ඔබ ලබනා බව. නොඉපදුන දරුවෙක් දරුගැබෙන් එළියට ඒමට තතනන්නා සේ බන්ධන සහිතව සිටින අය ශිව බාබාට අඬගසමින්, ''ශිව බාබා, මා මේ බන්ධනයෙන් මුදවන්න'' යැයි ඉල්ලයි. ඔවුන් දිවා රෑ ඔහු සිහිකරයි. ඔබ පරම පියාව හමු වුවත් අපරිස්සමින් සිතන්නේ ඔබ කොහොමත් බාබාගේ දරුවා කියාය. මා මේ ශරීරය අතහැර කුමාරයෙක් බවට පත් වනවා. මෙම සතුට ස්ථිරවම ඔබ තුළ තිබිය යුතුයි. කොහොමනමුත්, මායා ස්මෘතියෙන් සිටීමට ඉඩ නොදෙයි. ස්මෘතිය සමඟ ඔබ ඉතා සතුටින් සිටී. ස්මෘතියෙන් නොසිටියොත් දිගටම දැවේ. ඔබ රාවණ් රාජ්‍යය තුළ කල්ප භාගයක් ම දුක දැක ඇත. දිගටම අකල් මරණ තිබුණා. එහි කොහොමත් දුක ඇත. කෙනෙක් කොතරම් ධනවත් වුවත් ඔහුද දුක අත්විඳියි. අකල් මරණ ඇති වේ. සත් යුගයේ දී කිසිවෙක් අකාලයේ මිය යන්නේ නැත. අසනීප වන්නේ ද නැත. එකල, ස්වභාවිකව එක් ශරීරයක් අතහැර තව ශරීරයක් ගනී. ඒ සතුටේ දේශයයි. මිනිසුන් සිතන්නේ දෙව්ලොව යනු ඔබේ මවා ගැනීමක් පමණක් කියාය. ඔවුන් මෙසේ අසයි දෙව්ලොව ආවේ කොහි සිටද? ඔබ දන්නවා, ඔබ දෙව්ලොව වැසියන් බවත්, උපත් 84ක් ගන්නා බවත්. මේ නාටකයට පදනම වන්නේ භාරතයයි. ඔබ දන්නවා ඔබ පිරිසිදු දෙවි දේවතාවන් වී ක්ෂත්‍රියන් ද වී උපත් 21ක සිට අනතුරුව වෛශ්‍ය හා ශුද්‍ර බවට පත් වන බව. ඔබ දැන් නැවතත් බ්‍රහ්මින් බවට පත් වී සිටී. ස්වදර්ශන චක්‍රය ඉතා පහසුය. ශිව බාබා මෙහි සිට මෙය විස්තර කරයි. ඔබ තේරුම් ගෙන සිටිනවා ශිව බාබා මෙම බ්‍රහ්මා රථයට පැමිණ ඇති බව. බ්‍රහ්මා වන අය සත් යුගය මුලදී ක්‍රිෂ්ණා වන අයයි. ඔහු උපත් 84ක් ගනිමින් අපිරිසිදු බවට පත් වූ පසු පරම පියා ඇතුළු වී ඔහු හදාවඩා ගනී. ඔහු ඔහුටම මෙසේ කියයි මම මේ ශරීරය උපයෝගී කරගෙන ඔබව අයිති කර ගත්තා. දැන් මම ඔබව දෙව්ලොව ස්වාධිපත්‍යයට වටිනා බවට පත් කරවනවා. වටිනා බවට පත් වන අය රජදහනට ඇතුළු වනවා. මේ සඳහා ඉතා හොඳ හැසිරීමක් අවශ්‍යය. ප්‍රධාන දෙය පාරිශුද්ධියයි. අහිංසක මව්වරු පහර කන්නේ මේ නිසාය. ඇතැම් සිද්ධීන් වල පිරිමින්ද පහර කයි. ඔවුන් එකිනෙකා පාපය සඳහා කුලල් කා ගනිති. මෙහි බොහෝ කාන්තාවන් සිටින නිසා ''ශක්ති හමුදාව'' යන නම සිහි කෙරේ. මව්වරුන්ට වන්දනා වේවා! ඔබ දැන් රාග සෑයෙන් පිටතට විත් ඥාන සෑයේ වාඩි වී ඇත්තේ සුන්දරත්වය ලැබීම සඳහාය. ඔබ ද්වෝපූර් යුගයේ සිට රාග සෑයේ සිටියා. එකිනෙකා විෂ සහිත බන්ධනයට බන්ධන්නේ අපිරිසිදු බ්‍රාහ්මණයෝය. ඔබ වූ කලී පාපයෙන් තොර බ්‍රහ්මින්වරුය. ඔබ එම කොන්තරාත්තුව අවලංගු කර ඔවුන් ඥාන සෑයේ සිටුවයි. රාග සෑයේ දී ඔබ අවලස්සන වූවා සේම ඥාන සෑයේ දී ඔබ සුන්දරත්වයට පත් වේ. පරම පියා මෙසේ කියයි ඔබ එකට ජීවත් වුවත් පාපයේ නොගැලීමට දිවුරා පොරොන්දු වෙන්න. එම නිසයි ඔබට බාබා මුද්දක් පළඳන්නේ. ශිව බාබා, බාබා වනවා සේම මනමාලයා ද වෙයි. ඔහු සියලු සීතාවන්ගේ රාමාය. පාරිශුද්ධකරුවාණන්ය. ඔහු රගු පැලැන්තියේ නායකයා වූ රාමා නොවේ. ඔහු එම තත්ත්වය ලැබුවේ සංගම් යුගයේ දීය. ප්‍රචණ්ඩත්වයේ සලකුණු වන දුණු ඊතල වලින් ඔහුව පෙන්වීම වැරදිය. එය පිංතූර වල පෙන්විය යුතු නොවේ. ඔබ ''චන්ද්‍ර වංශය'' යන්න පමණක් ලියා තබන්න. ඔබ දරුවන් තේරුම් කර දිය යුතුයි, ශිව බාබා මේ මඟින් චක්‍රයේ රහස් අපට විස්තර කරන බව. සත්‍ය නාරායනගේ කතාන්තරය තිබේ. එය සාදා ඇත්තේ මනුෂ්‍යයින්ය. කිසිම කෙනෙක් එම කතාව තුළින් සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන බවට වෙනස් වන්නේ නැත. සත්‍ය නාරායන කතාන්තරයේ තේරුම නම්, සාමාන්‍ය මිනිසෙක් නාරායන බවට වෙනස් වීමයි. මිනිසුන් අමරණීයත්වයේ කතාන්තරය ලිව්වත් කිසිවෙක්

අමරණීය දේශයට නොයයි. මරණයේ දේශයේ ම දිගටම අවුරුදු 2500ක් පවතී. මච්චරුන් තෙවෙනි ඇසේ කතාන්තරයට කන් දෙයි. ඇත්තෙන්ම එය තෙවෙනි ඇස පාදා දීමේ කතාන්තරයයි. ඔබ ජීවාත්ම සත්තාවන් හැම කෙනෙක්ම දැන් ඥානය නම් තෙවැනි ඇස ලැබීම නිසා ජීවාත්ම සත්තා විඥානයට පත් විය යුතුයි. ජීවාත්ම සත්තා වන මා දැන් මෙම ශරීර තුළින් දෙවි දේවතා තත්ත්වයට පත් වෙමින් සිටී. මිනිසුන්, ජීවාත්ම සත්තාවත් පරමාත්මයත් එකහා සමාන වේ යැයි ද, දෙවියන් එම හැම ස්වරූපයක්ම යොදා ගනී යැයි ද පවසයි. පරම පියා මෙසේ කියයි එය සාවද්‍යය. ඊට ව්‍යාජ ආඩම්බරය හා ව්‍යාජ ඥානය යැයි කියයි. පරම පියා ඔබට කියා දෙන්නේ ඔහු කුඩාම කුඩා ලකෂ්‍යයක් කියාය. පෙර ඔබ මෙය නොදැන සිටි අතර මොහුද දැන සිටියේ නැත. පරම පියා මෙය විස්තර කර දෙන අතර මෙහි කිසිදු සැකයක් තිබිය යුතු නොවේ. ස්ථිර ශ්‍රද්ධාව තිබිය යුතු වේ. බාබා නිරතුරුව සත්‍යය ම කියා දෙයි. සැකයෙන් යුතු බුද්ධිය ඇති අය විනාශයට පත් වේ. ඔවුන් සම්පූර්ණ උරුමය ලබන්නේ නැත. උත්සාහය අවශ්‍ය වන්නේ ජීවාත්ම සත්තා විඥානයට පැමිණීමටයි. ආහාර පිසීමේදී ඔබේ බුද්ධිය පරම පියා හා සම්බන්ධ කරන්න. හැම විටෙකදීම මෙය පුහුණු කරන්න. චපාති හදන විට දීද ඔබේ ආදරවන්තයා සිහිකරන්න. සෑම දේකම මෙම පුරුද්ද තිබිය යුතුයි. වෙලාව ඇති සෑම විටකම ස්මෘතියේ සිටින්න. ඔබ සතෝප්‍රධාන් වන්නේ ස්මෘතියෙන් පමණි. ඔබේ වැඩ සඳහා නිදහස් පැය අටක් ඇත. ඒ අතරතුර දී ගොස් හුදකලාව වාඩිවෙන්න. හැම කෙනෙකුටම පරම පියා හඳුන්වා දෙන්න. අද නොවුණත් ඔවුන් හෙට එයට ඇහුම්කන් දෙයි. පරම පියා දෙව්ලොව ස්ථාපනය කරයි. අපි දෙව්ලොව වැසියන්ව සිට දැන් අපායේ වැසියන් බවට පත් වී ඇත. අප දැන් නැවතත් පරම පියාගෙන් උරුමය ලබමු. පරම පියා විස්තර කරන්නේ භාරත්වාසීන්ට පමණි. ඔහු එන්නේ භාරතයට පමණි. සික්වරු සහ කිතුණුවන් ද පැමිණෙයි. අනාගතයේ දී බොහෝ අය එයි. මෙය පරම පියාගෙන් ලැබෙන පහසු උරුමය හා පහසු ස්මෘතිය නිසා මෙම ඥානය හැම කෙනෙකුටම අයිතිය. කොහොමනමුත්, ඔබ නියතයෙන්ම පිරිසිදුව සිටිය යුතුය. එසේ පාපය දානය කිරීමෙන් රාහු අපලය දුරු වනු ඇත. දැන් භාරතයට ඇත්තේ රාහු අපලය වන නමුත් ඉන්පසු උපත් 21ක් බ්‍රහස්පති ලබයි. පළමුව, බ්‍රහස්පති වන අතර ඉන්පසු සිකුරා ලබයි. සූර්ය වංශිකයින්ට බ්‍රහස්පති වන අතර චන්ද්‍ර වංශිකයන්ට ලබා ඇත්තේ සිකුරුය. ඉන්පසු ඒවා අඩු වී යයි. නරකම නම් රාහු අපලයයි. බ්‍රහස්පති යනු ගුරු කෙනෙක් නොවේ. වෘක්ෂ දේවතාවා යැයි ග්‍රහ බලපෑමක් ද ඇත. වෘක්ෂ දේවතාවා වන පරම පියා පැමිණියාට පසු බ්‍රහ්පති හා සිකුරා එල දේ. රාවණ් පැමිණි විට ඇත්තේ රාහු අපලයයි. ඔබ දරුවන් දැන් අත්විඳින්නේ බ්‍රහස්පති එලයයි. වෘක්ෂ දේවතාව සිහිකර පාරිශුද්ධව සිටින්න. එපමණයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සියල්ල කරන අතරවාරයේ ජීවාත්ම සත්තා විඥානය පුරුදු පුහුණු කරන්න. ශරීරයේ ආඩම්බර බව අවසාන කිරීමට උත්සාහ දරන්න.
2. සත් යුග ආධිපත්‍යයට වටිනා බවට පත් වීම සඳහා රාජකීය අයුරින් සිටින්න. ඉහළම හැසිරීමේ ක්‍රමය පාරිශුද්ධියයි. පාරිශුද්ධ ලෝකයේ හිමිකරුවා බවට පත් විය හැක්කේ පාරිශුද්ධ බවට පත් වීමෙන් පමණි.

**වරදානය:** ඔබ කරන්කරවන්හාර් (ඔබට ක්‍රියා කිරීමට දිරිගන්වන සහ තමන්ම ක්‍රියා සිදු කරන ඒකායන කෙනා) පිලිබඳ අවධානය ඇතිව සහජ යෝගාව අත්විද ඒ අනුව සාර්ථකත්වයේ ප්‍රතිරූවක් වේවා.

ඕනෑම කාර්යයක් සිදුකරන අතර, ඔබව උපකරණයක් බවට පත් කළ ඒකායන කෙනා, එනම් කොඳු නාරටිය කවුරුන්ද කියා අවධානයේ තබා ගන්න. කොඳු නාරටිය නොමැතිව ඔබට කිසිම කාර්යයකින් සාර්ථකත්වය ලබා ගත නොහැක. එබැවින් ඔනෑම කාර්යයක් සිදු කරන අතර ඔබ උපකරණයක් බවත්, සෑම දෙයක්ම සිදු කරවන්නේ සර්ව බලධාරී පියාම පමණක් බව සිතන්න. මෙම අවධානයෙන් සෑම දෙයක්ම සිදු කරන්න එවිට යෝගාව පහසු බව ඔබ අත්විදියි. මෙම සහජ යෝගාව එවිට ඔබට පහසුවෙන් රාජධානියක් පාලනය කිරීමට මගපාදයි. මෙහි ඇති ඔබගේ සංස්කාර ඔබව එහි රැගෙන යයි.

**පාඨය:** ආශාවන් සෙවණැලි මෙනි; ඔබ ඒවාට පිටුපාන්නේ නම්, එය ඔබ පසුපස පැමිණෙයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරිබව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

මිහිරිබව කෙතරම් විශේෂ ගුණදහමක්ද යත්, එය අමිහිරිබවින් පිරි භූමියක් වුවද බොහෝ මිහිරි කරවයි. ඔබ සියළු දෙනාගේ පරිවර්ථනයේ පදනම බාබාගේ මිහිරි වදන්ය: සුමිහිරි දරුවනේ, ඔබ පිවිතුරු මිහිරි ජීවාත්මයි. මෙම මධුර වදන් ඔබව පරිවර්ථනය කළා. බාබාගේ මිහිරි දෘෂ්ඨිය ඔබව පරිවර්ථනය කළා. ඒ අන්දමින්ම, ඔබගේ මිහිරියාවෙන් අන් අයව මිහිරි කරවන්න. ඔබගේ මුව මිහිරි කරගන්න. නිරන්තරයෙන් මෙම මිහිරිබවේ තිලිණය ඔබ සමග තබා ගන්න. මෙසේ කිරීමෙන්, ඔබ නිරතුරුවම මිහිරිව රැඳී සිටින අතර ඔබ අන් අයවත් මිහිරි කරයි.